# හඳගම නොදත් අක්ෂරය

මෙරට කලාව හා කලා විචාරයද, විශේෂයෙන් ම නවකතා, කෙටි කතා, සිනමා විචාරය මුළුමනින්ම බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි අනුකරණ වෙයි. මේ අනුකරණවලින් බොහෝ විට කෙරෙන්නේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය මෙරට පැතිරවීමත් අනෙක් සංස්කෘතීන්, විශේෂයෙන් ම සිංහල බෞද්ධ සංස්කෘතිය, නැති කිරීමට බැරි නම් දුර්වල කිරීමට කටයුතු කිරීමත් ය. බටහිර කලාව ද ඇතුළු බටහිර නිර්මාණය වන දැනුම බටහිර සංස්කෘතික ආධිපත්‍යය ප්‍රචලිත කිරීම සඳහා යොදා ගැනෙයි. ඇතැමුන් මේ සංස්කෘතිය යටත් විජිතවාදයෙහි අවිඥානික දැති පමණක් විය හැකිය. එහෙත් තවත් අය දැනුවත් ව ඒ කටයුත්තේ යෙදී සිටිති. හඳගමගේ කලාවෙන් හා ඒ පිළිබඳ ඔහු දක්වන අදහස්වලින් පැහැදිලි වන්නේ ඔහු ද පසු කී ගණයට අයත් බව ය.

අක්ෂරය පිළිබඳව අද ඇති වී තිබෙන සංවාදය දිගින් දිගටම පුවත්පත් හා අනෙක් ජනමාධ්‍ය ඔස්සේ කරගෙන යෑම අවසාන වශයෙන් වාසිදායක වන්නේ අක්ෂරයටවත්, පොදුවේ කලාවටත්, රටටවත් නොව අශෝක හඳගමටය. හඳගම ඒ බව නොදන්නවා නොවේ. එහෙත් ඔහු ඒ පිළිගනිවීදැයි මම නොදනිමි. මා දැක්මෙහි ලියූ ජේළි කිහිපයක් පදනම්කරගෙන ඔහු පිටු බාගයකට වඩා ලියයි. සෑම සතියකම අක්ෂරය පිළිබඳ ලිපි පුවත්පත්වල පළවෙයි. අක්ෂරය අවසානයේ දී ප්‍රදර්ශනය වුවත් නැතත් හඳගමට අවශ්‍ය ප්‍රසිද්ධිය දැන් ලැබී ඇත. මෙයින් කියැවෙන්නේ ඔහුට කලින් ප්‍රසිද්ධියක් නොතිබූ බව නොවේ. ඔහු අද කලාවේ සියලු වාරණවලට කොන්දේසි රහිතව විරුද්ධ වෙයි. ඔහු කැනහිල්ලන් යනුවෙන් හඳුන්වන ඇතැමුන්ගෙන් "කලාව හා ප්‍රකාශනයේ පරිකල්පනීය සීමාවන් මුදාගන්නට දිවිහිමියෙන් පෙනී සිටින" බව කියයි. කොතරම් උදාර කියමනක් දැයි කිසිවකු සිතන්නට ඉඩ ඇත. එහෙත් අක්ෂරයේ තහනමට විරුද්ධව තිස්ස අබේසේකර මහතාට හා ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාට එලෙස දිවි හිමියෙන් පෙනී සිටීමට වුවමනාවක් නැද්ද ? ලෙස්ටර් පීරිස් ඩා වින්චි කෝඩ් තහනමට විරුද්ධව සටනට නොගියේය. මා දන්නා තරමින් ඔහු ඒ සම්බන්ධයෙන් මුනිවත රකියි. කතෝලික බැතිමතකු යැයි කියන ඒ මහතාගේ සිත ඩා වාන්චි කෝඩ් චිත්‍රපටයෙන් හෝ පොතෙන් හෝ ඒ දෙකෙන්ම හෝ රිදුණි දැයි අපි නොදනිමු. අනෙක් අතට තිස්ස අබේසේකර මහතාට අනුව යම් ජනකොටසකගේ සිත රිදෙන කලා කෘතියක් තහනම් කිරීමේ වරදක් නැත. කලා වාරණයට විරුද්ධවීම පිළිබඳව ද යම් සාපේක්ෂතාවක් ඇත. ඒ දෙදෙනාගෙන් කවරකුවත් හඳගම මෙන් නොව කලාව හා ප්‍රකාශනයේ පරිකල්පනීය සීමාවන් මුදාගන්නට දිවිහිමියෙන් පෙනීසිටීමට සූදානමක් නැති බව පැහැදිලිය.

කලකට පෙර පියසේන කහඳගමගේ මහතා වනවදුලේ වසන්තය නමින් නවකතාවක් ලිවීය. නවකතාව තහනම් නොවිණි. එහෙත් ඒ පොත පදනම් කරමින් නිපදවූ ටෙලි නාට්‍යයක් සති කිහිපයක් විකාශය කිරීමෙන් පසු තහනම් කෙරිණි. එයට හේතුව වූයේ එහි එක් චරිතයක් වූ මුස්ලිම් වෙළෙඳකු නිසා දිගාමඩුල්ලේ ගමකට දුශ්චරිත පුරුදු වූ බව ටෙලිනාට්‍යයෙන් (හා පොතෙන්) නිරූපණය වීම ය. එවැනි චරිතයකින් මුස්ලිම් ජනයාගේ හිත රිදෙන බව හෝ මුස්ලිම් ජනයාට අපහාසයක් වන බව හෝ ප්‍රකාශ විණි. ටෙලිනාට්‍ය තහනම් කිරීමට විරුද්ධව කිසිවකු දිවි පිදූ බව මට මතක නැත. එකල හඳගම රටේ නොසිටියේ දැයි නොදනිමි. එහෙත් දැන් නම් ඔහු ජීවතුන් අතර රටේ සිටින බව පුවත්පත් කියවන ගුවන් විදුලියට සවන් දෙන බොහෝ අයට රහසක් නොවේ. එදා ඒ තහනම කළේ පියසේන කහඳගමගේ මහතා අදාළ ගමේ එවැන්නක් සිදුවූ බව පුන පුනා කියද්දීය.

හඳගම තමාගේ ජුනි 4 ප්‍රශ්නෝත්තර ලිපියෙහි මා දෙකොණින් කතාකරන බව කීවේ මා අක්ෂරය තහනමට පක්ෂ වුව ද ඩා වින්චි කෝඩ් තහනමට විරුද්ධ යැයි සිතාගෙන ය. ජුනි 11 වැනිදා දැක්ම පටන්ගත්තෙත් ඒ සිද්ධිය සඳහන් කරමින් වුවත් මට අවශ්‍ය වූයේ තහනම්වල ඇති සාපේක්ෂතාව ගැන සඳහන් කිරීමටය. මගේ කතාව තුළ පිළිබිඹුවන්නේ නිරුවත් වර්ගවාදය යැයි ඔහු කිසිදු හේතුවක් නොදක්වා එදා කීවේය. ඔහුට ඒ සඳහා න්‍යායක් (මෙහි වරහනක් තුළ මා ලොජික් කියා සඳහන් කළේ බොහෝ දෙනා ලොජික් යනුවෙන් තර්කය හඳුන්වන නිසාත් න්‍යාය යන්න තියරි සඳහා යොදන බැවිනුත් ය. පෙරදිග දර්ශනයේ න්‍යාය යනුවෙන් හැඳින්වෙන්නේ ලොජික් මිස තියරි නො වේ.) නොතිබිණි. ප්‍රශ්නය වූයේ යමකු දෙකොණින් කතාකළත් ඒ වර්ගවාදී වන්නේ කෙසේ ද යන්න ය. දෙකොණින් කතා කළ පමණින් (මා දෙකොණින් කතා නොකළ බව පාඨකයාට මේ වනවිට අවබෝධ වී ඇතැයි සිතමි.) යමකු වර්ගවාදීවන්නේ නම් අක්ෂරය තහනම සම්බන්ධයෙන් විරෝධය පා ඩා වින්චි කෝඩ් සම්බන්ධයෙන් නිහඬවන

© Prof. Nalin De Silva

ලෙස්ටර් පීරිස් දෙකොණින් කතා කර ඇත්නම් ඔහු කුමනවාදියෙක්ද? අක්ෂරය තහනමට විරුද්ධ එහෙත් ඩා වින්චි තහනමට පක්ෂ තිස්ස අබේසේකර ද දෙකොණින් කතාකර ඇත්ද? ඔහු ද වර්ගවාදියෙක්ද? ආදී ප්‍රශ්න හඳගමගේ අදාළ ලිපියෙන් මතුවෙයි. ඔහුගේ න්‍යාය පිළිබඳ ව මා ජුනි 11 වැනි දා ලිපියෙන් ප්‍රශ්න කිරීමෙන් පසුව හඳගම තමාගේ නිගමනයෙහි න්‍යායක් හෝ තර්කනයක් (රීසනින්) හෝ නොමැති බව වටහාගෙන, එදා ඔහු මගේ කතාවෙන් පිළිබිඹු වන්නේ වර්ගවාදය ය යන නිගමනයට පැමිණියේ පහත සඳහන් ආකාරයට (මා පෙළගස්වා ඇති) න්‍යායට අනුව යැයි ජුනි 18 වැනිදා කියයි.

"ජවිපෙ ද, හෙළ උරුමය ද, දේශ හිතෛෂී ව්‍යාපාරයද , මහින්ද චින්තනය ද, නලින් ද සිල්වා හැඳිගාන්නේ එකම තලපයකි. අදාළ ගුවන්විදුලි සාකච්ඡාවට සහභාගි වූ නලින් ද සිල්වා ස්ථානගත වූයේ හඳගම විසින් අගලකඩ නමින් හඳුන්වනු ලබන අගලකඩ සිරිසුමන හිමියන්ගේ හා උදය ගම්මන්පිලගේ ගොඩේ ය. උදය ගම්මන්පිලගේ න්‍යායාචාර්ය වූ චම්පික රණවක ඩා වින්චි කෝඩ් චිත්‍රපටය කෙසේ හෝ ලංකාවේ පෙන්විය යුතු බව කියා ඇත. චම්පික රණවක එසේ කියා ඇත්තේ ක්‍රිස්තුභක්තිකයන්ගේ සිත් රිදවීමේ යටි අරමුණෙන් ය. තමන් අයත්වන ආගමට ජාතියට කුලයට ආදියට අයත් නොවන කෙනකු ශාරීරික ව හෝ මානසිකව හෝ පෙළීමෙන් තෘප්තියක් ලැබිය හැකි නම් සරලව ඒ නග්න වර්ගවාදයේ පිළිබිඹුවකි. එම නිසා නලින් ද සිල්වාගේ කතාවෙන් පිළිබිඹු වන්නේ නිරුවත් වර්ගවාදය ය."

මෙය හඳගම මගේ ප්‍රශ්නයට පිළිතුරු ලෙස පසුව ගොඩනැගුවක් බව පැහැදිලිය. එහෙත් එහි න්‍යායක් හෝ තර්කණයක් හෝ නැත. එහි ඇත්තෙතත් උපකල්පන හා හිස්තැන් පමණ ය. චම්පික රණවක ඩා වින්චි කෝඩ් චිත්‍රපටය ලංකාවේ පෙන්විය යුත්තේ ක්‍රිස්තු භක්තිකයන්ගේ සිත් රිවීමේ යටි අදහසින් බව හඳගම දන්නේ කෙසේද? ඒ හඳගමගේ උපකල්පනයක් පමණකි. චම්පික රණවකට එහිදී වෙනත් අරමුණු තිබෙන්නට නැතැයි කිව හැකිද? අක්ෂරය තහනමට විරුද්ධවන්නන්ගේ කුහක පිළිවෙත හෙළිදරවු කිරීම චම්පික රණවකගේ යටි අදහස විදැයි අපි නොදනිමු. හඳගම යටි අදහස් ගැන කියන්නේ ඒ සාධක සහිතව අනෙක් දෑ සමග සංගතවන අයුරින් පෙළගස්වා නොව පරචිත්තවිජානන ඥානය ලැබුවකු තමන් අත්දුටුවක් කියන ආකාරයෙන් ය. ඔහුට අනුන්ගේ හිත් කියවීමේ හැකියාවක් ඇතැයි යන්න හෝ වෙනත් අයට හෝ එවැනි හැකියාවක් ඇති බවක් ඔහු විශ්වාස කරන්නේද යන්න හෝ ගැන අපට දැනුමක් නැත. ක්‍රිස්තුභක්තිකයන්ගේ සිත් රිදවීමේ යටි අදහසක් චම්පික රණවකට තිබිණි යැයි අපි මොහොතකට සිතමු. එහෙත් එපමණකින් චම්පික රණවක තමන් අයත්වන ආගමට, ජාතියට, කුලයට ආදියට අයත් නොවන කෙනකු ශාරීරිකව හෝ මානසිකව හෝ පෙළීමෙන් තෘප්තියක් ලබන්නේ යැයි කියන්නේ කෙසේ ද? මිනිසුන් තම ආගමට, කුලයට අයත් වූ හෝ නොවූ අනෙක් අයගේ සිත් රිදවන්නේ තෘප්තියක් ලැබීමට පමණක් ද? ඇතැම් විට මිනිසුන් පළිගැනීමට එසේ කරනවා විය හැකිය. නැතහොත් මෝඩකම නිසා හෝ වෛරය නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ එසේ කරනවා විය හැකිය. හඳගම වර්ගවාදය යන්නට නිර්වචනයක් නිර්මාණය කරගෙන ඇත. නිර්වචන නිර්මාණය එතරම් පහසු කටයුත්තක් නොවේ. හඳගමගේ නිර්වචනයෙන් වර්ගවාදය යනු කුමක්දැයි හඳුනා ගැනීමට නො හැකිය. කෙසේ වෙතත් ඕනෑම කලාව මුදාගැනීමට දිවිහිමියෙන් පෙනී සිටි හඳගම වර්ගවාදී කලාකෘතියක් වෙනුවෙන් වුවද පෙනී සිටීමට සූදානම්ය. එනම් ඔහුට යම් ආගමකට, කුලයකට ආදී වශයෙන් අයත් වුවන්ගේ සිත් රිදවීමට වුවද ඔහුගේ විරුද්ධත්වයක් නැත.

හඳගම ඒ නිර්වචනයක් නොව සරල හඳුනාගැනීමක් යැයි ඇතැම්විට කියනු ඇත. එසේ වුවද තමන් අයත්වන ආගමට, ජාතියට, කුලයට ආදියට අයත් නොවන කෙනකු ශාරීරිකව හෝ මානසිකව හෝ පෙළීමෙන් තෘප්තියක් ලැබිය හැකි නම් සරලය. ඒ නග්න වර්ගවාදයේ පිළිබිඹවුකි යැයි කීමෙන් වර්ගවාදය ගැන සරලව හෝ කිසිවක් නොකියැවෙයි. කුලය, ජාතිය කුමක් වුවත් වෙනත් අයකු ශාරීරිකව හෝ මානසික ව පෙළීමෙන් තෘප්තියක් ලබන අයකු අතින් තම කුලයට ආදියට අයත් නොවන්නකු එලෙස පෙළනු ලැබුවහොත් එතැන ද ඇත්තේ වර්ගවාදයද? මෙරට බොහෝ අය සිතන්නේ නිර්මාණ කරන්නේ කලාකරුවන් පමණක් බවය. එහෙත් සංකල්පයක්, නිර්වචනයක්, ප්‍රවාදයක් ආදිය ද නිර්මාණය කළ යුතුවා පමණක් නොව ඒ පහසු කාර්යයක් ද නොවේ. කෙසේ වෙතත් අපි දැන් මොහොතකට චම්පික රණවක වර්ගවාදියකු යැයි නිගමනය කරමු. එපමණකින් උදය ගම්මන්පිල වර්ගවාදියකු වන්නේද? ගම්මන්පිලගේ න්‍යායාචාර්යයා වර්ගවාදියකු වූ පමණින් ගම්මන්පිල ද වර්ගවාදියකු වන්නේ ද? අනෙත් අතට චම්පික රණවක, ගම්මන්පිලගේ න්‍යායාචාර්යයා කියන්නේ කෙසේද? ගම්මන්පිල සමග මා ස්ථානගත වී යැයි කීමෙන් පමණක් ගම්මන්පිල වර්ගවාදියකු වූ බැවින් මා ද වර්ගවාදියකු වන බව හඳගම කියන්නේ ද? මේ සියල්ල

© Prof. Nalin De Silva

ගතරබීරී කතා පමණය. හඳගමට පැහැදිලි න්‍යායක් හෝ තර්කයක් හෝ නැත. එහෙත් ඔහුගේ අර තලප කතාවට මම කැමැත්තෙමි. ප්‍රශ්නය ද මේ තලපය ම යැයි සිතෙයි. ඒ තලපය හැදිගාන අය ලෙස ඔහු විසින් හඳුන්වනු ලබන්නෝ මෙරට ප්‍රබුද්ධයන්ට අනුව වර්ගවාදීහු වෙති. ඒ කුමන නිර්වචනයකට අනුව දැයි ඔවුහු නො කියති. හඳගම මෙරට ප්‍රබුද්ධයන් විසින් ප්‍රබුද්ධ කලාකරුවකු ලෙස සලකනු ලැබෙයි. අප කියන දෑ ප්‍රබුද්ධයනට අනුව වර්ගවාදී කතා වෙයි. වර්ගවාදීන් කරන කතාවලින් වර්ගවාදී බව පිළිබිඹුවන්නේ යැයි ඔහු තම ප්‍රශ්නෝත්තර ලිපියෙහි උපකල්පනය කර ඇත්තේ එබැවිනි. දැන් එයට ඊනියා න්‍යායක් දීමට ගොස් ඔහු හත්පොළේ ගා ගනියි.

එකී තලපය යනු අන් කිසිවක් නොව මෙරට ජාතිකත්වය යි. ජවිපෙ, හෙළ උරුමය මෙන්ම මම ද මෙරට ජාතිකත්වය වෙනුවෙන් පෙනී සිටිමි. අප අතර මත භේද ඇත. අපේ අරමුණු ද විවිධ ය. මම මේ එක් කණ්ඩායමකට හෝ පක්ෂයකට හෝ පක්ෂපාතී නො වෙමි. ඒ ඒ කණ්ඩායම්වල හා පක්ෂවල සාමාජිකයන් මගේ ඇතැම් අදහස්වලට විරුද්ධ ය. මෙහිදී අනෙක් අය ගැන කතාකිරීමට මට නොහැකිය. මම මගේ අදහස් ගැන පමණක් කතා කරමි. මම දෙමළ ජාතිවාදයට විරුද්ධ වෙමි. මෙරට දෙමළ ජාතිවාදයක් ඇති බව ද, එය බටහිරයන්ගේ නිර්මාණයක් බව ද, බටහිරයන් සිංහලත්වයට විරුද්ධව ඒ හදා වඩාගත් බව ද, ඒ අර්ථයෙන් දෙමළ ජාතිවාදය බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත් විජිතවාදයෙහි අවයවයක් බව ද මගේ පිළිගැනීම වෙයි. මට ඒ බව සංගත ව සනාථ කළ හැකි ය. දැනට අවුරුදු පහළොවකට වැඩි කාලයක් තිස්සේ මම මේ මතවාදය ගොඩනගන්නෙමි. එය තවම අවසානයකට පැමිණ නැත. දිනෙන් දින මතවාදය ද වර්ධනය වෙයි.

මෙරට සිංහලයන්ගෙන් හා විශේෂයෙන් ම සිංහල බෞද්ධයන්ගෙන් අතිවිශාල බහුතරය සිංහලත්වයට පක්ෂපාතී වෙති. ඔවුහු ද අර තලපය හැදිගාති. දේශපාලනඥයෝ මැතිවරණ සමයේදී මේ බහුතරය ඩැහැගැනීමට විවිධ කතා ඇදබාති. එපමණ ය. ප්‍රබුද්ධයන් කියන ආකාරයට නොව මෙරට සිංහල බෞද්ධ අධිපතිවාදයක් නැත. සාමාන්‍ය මිනිසුන්ගේ අතිමහත් බහුතරය සිංහල බෞද්ධ වූ පමණින් හා මැතිවරණයේදී ඔවුන්ගේ ඡන්දය ඩැහැගැනීමට බොහෝ දේශපාලනඥයන් සිංහල බෞද්ධ වෙස් මුහුණක් බැඳගත් පමණින් මෙරට ඇත්තේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි ආධිපත්‍යයක් ය යන්න නිෂ්ප්‍රභ නොවෙයි. මෙරට අධ්‍යාපනය මුළුමනින්ම මෙන් බටහිර යුදෙව් ක්‍රිස්තියානි වෙයි. මෙරට විශ්වවිද්‍යාල යනු බටහිර යුදෙව් ක්‍රිස්තියානි ආධිපත්‍යයෙහි බලකොටු වෙයි. ජනමාධ්‍යවල සිටින අයගෙන් කිහිපදෙනකු හැරෙන්නට අනෙක් අය බොරු බටහිර ප්‍රබුද්ධත්වය ආරෝපණය කරගැනීමට සිංහල බෞද්ධ සංස්කෘතියට තඩිබාති. ජනමාධ්‍යයෙහි ආධිපත්‍යය ඇත්තේ බටහිර නූතනත්ව ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නිවට අනුකාරකයන්ට බැවින් ජනමාධ්‍යයෙන් පිළිබිඹු කිරීමට උත්සාහ කරන්නේ සිංහල බෞද්ධ සංස්කෘතිය පරාජය වී ඇති බව ය. එහෙත් මෙරට බටහිර ක්‍රිස්තියානි ආධිපත්‍යයක් තිබුණ ද, මැතිවරණ සමයේදී ප්‍රබුද්ධයන් ජනමාධ්‍ය ඔස්සේ මොන තරම් වහසි බස් දෙඩෙව්වද මැතිවරණවලට ජනමාධ්‍යයෙන් විශාල බලපෑමක් එල්ල නොවේ. ජනතාව ජනමාධ්‍ය ඇසුරු කළ ද ඒ තුට්ටුවකටවත් ගණන් නොගන්නා බව පැහැදිලිය. ඔවුහු ජාතිකත්වය වෙනුවෙන් ඡන්දය දෙති. අර තලපයට, එනම් ජාතිකත්වයට තරම් අනුකාරකයන් බියවන වෙනත් දෙයක් නැත.

මෙරට කලාව හා කලා විචාරයද, විශේෂයෙන් ම නවකතා, කෙටි කතා, සිනමා විචාරය මුළුමනින්ම බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි අනුකරණ වෙයි. මේ අනුකරණවලින් බොහෝ විට කෙරෙන්නේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය මෙරට පැතිරවීමත් අනෙක් සංස්කෘතීන්, විශේෂයෙන් ම සිංහල බෞද්ධ සංස්කෘතිය, නැති කිරීමට බැරි නම් දුර්වල කිරීමට කටයුතු කිරීමත් ය. බටහිර කලාව ද ඇතුළු බටහිර නිර්මාණය වන දැනුම බටහිර සංස්කෘතික ආධිපත්‍යය ප්‍රචලිත කිරීම සඳහා යොදා ගැනෙයි. ඇතැමුන් මේ සංස්කෘතිය යටත් විජිතවාදයෙහි අවිඥානික දැති පමණක් විය හැකිය. එහෙත් තවත් අය දැනුවත් ව ඒ කටයුත්තේ යෙදී සිටිති. හඳගමගේ කලාවෙන් හා ඒ පිළිබඳ ඔහු දක්වන අදහස්වලින් පැහැදිලි වන්නේ ඔහු ද පසු කී ගණයට අයත් බව ය. කිසිම කලා කෘතියක් දේශපාලනයෙන් මුළුමනින්ම වෙන් නොවෙයි. කලාව නමින් වෙනම දෙයක් ඇතැයි යන අදහස ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සමඟ ජනිත විය. එහි ආරම්භකයෝද අද බෙහෙවින්ම කතාබහට ලක්වන ලියනාඩෝ ඩා වින්චි වැන්නෝ ය. බටහිර ක්‍රිස්තියානි (කතෝලික නොවන) සංස්කෘතියෙහි මූලික කරුණක් වන්නේ වෙන් කිරීම ය. පුද්ගලයන් අනෙක් පුද්ගලයන්ගෙන් ද විෂය අනෙක් විෂයන්ගෙන් ද වෙන් කිරීම ආදී වශයෙන් මතුපිටින් වෙන්කිරීම ඇරඹුණේ බටහිරයන් පුනරුදය නමින් හඳුන්වන ක්‍රිස්තියානි නූතනත්වයේ ආරම්භයත් සමගය. එයට පෙර කලාව, කලාවක් ලෙස මතුපිටින් හෝ වෙන්ව නොපැවතුණි. කලාව, කලාව ලෙස වෙන්වූයේ බටහිර නූතනත්වයෙන් පසුවය. එහෙත් මතුපිටින් එලෙස

© Prof. Nalin De Silva

වෙන් කෙරුණද ඒ එකිනෙක සමග සම්බන්ධ වන්නේ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය නිසා ය. වෙන්කිරීම සිදුවන්නේ මතුපිටින් පමණ ය. ඇතුළෙන් ඒ සියල්ල, විද්‍යාව ද, කලාවද, දර්ශන ද, අනෙක් දෑ ද එක චින්තනයක අන්‍යොන්‍ය ව සම්බන්ධ වූ කොටස් පමණක් වෙයි. අප කෙදිනකවත් නොවෙනස් වන සංස්කෘතියක් ගැන හෝ නොවෙනස් වන චින්තනයක් ගැන කතාකර නොමැති බව අවධාරණය කළ යුත්තේ ඇතැම් බොරු ප්‍රබුද්ධයන් එවැනි මත ප්‍රචාරය කරන බැවිනි. කලාව, දේශපාලනයෙන් මුළුමනින්ම වෙන් නොවන්නේ ඒ චින්තනයෙන් බැඳී ඇති හෙයිනි. කලාව, කලාව සඳහා ය යන්න බොල් සටන් පාඨයක් බවත්, අනුකාරක පුස්සන්ට තමන් ප්‍රබුද්ධයන් බව සිතා ගැනීමට දී ඇති මතයක් පමණක් බවත් අවධාරණය කළ යුතු ය. ඇතැමුන්ගේ සිනමා හා වෙනත් නිර්මාණවල දේශපාලනය ඇත්තේ සැඟවී ය. එහෙත් හඳගමගේ සිනමාවෙහි දේශපාලනය නග්නව ම ඉදිරියට එයි. අපට වටහාගැනීමට ඇත්තේ ඒ දේශපාලනය කා වෙනුවෙන්ද යන්න පමණය.

හඳගම අගලකඩ සිරිසුමන හිමියන් හඳුන්වන්නේ අගලකඩ නමින් ය. මෙරට සිංහල බෞද්ධයෝ පාරාජිකා වූ භික්ෂුන් වහන්සේ නමක වුවද සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියේ නමින් පමණක් නොහඳුන්වති. ඒ එසේ නොවන බවට සාධක ඇතැයි කිසිවකු කීමට හැකිය. ඇතැමුන් තම මිතුරන් අතර සිටින විට භික්ෂුන් වහන්සේ නමක එලෙස නමින් හෝ ගෞරව සම්පන්න නොවන වෙනත් ආකාරයකින් හෝ හැඳින්වුවද ප්‍රසිද්ධියේ එසේ නොකරති. ඒ මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියයි. ප්‍රසිද්ධියේ ගරු කිරීමත්, අප්‍රසිද්ධියේ ගරු නොකිරීමත් කුහකවතක් යැයි බොරු ප්‍රබුද්ධයකු කීමට බැරි නැත.එහෙත් ඒ කුහක වතක් නොව සමාජ සම්මුතියට හා සමාජය එකට තබා ගැනීමට තවමත් උත්සාහ දරන හර පද්ධතියකට ගරු කිරීම ය. ඉන් කියැවෙන්නේ තමන් භික්ෂුන් වහන්සේ නමක නමින් පමණක් හැඳින්වීම සිංහල බෞද්ධ සංස්කෘතියට සාපේක්ෂව වැරැදි බව දන්නා බව හා ඒ වැරැද්ද ප්‍රසිද්ධියේ කිරීමට මැලිවන බවය. කලකට පෙර මෙරට බොහෝ දෙනා මත්පැන් පානය කළේ ප්‍රසිද්ධියේ නොව අප්‍රසිද්ධියේය. ඒ මත්පැන් පානය කිරීම මෙරට සංස්කෘතියට සාපේක්ෂව වරදක් බව දන්නවුන් ක්‍රියා කළ ආකාරය ය. ඔවුන් එසේ කෙළේ සමාජය සී සී කඩ ව යෑමට එරෙහිව ඇති බැමි ආරක්ෂා කිරීමට ය. ඒ බැමි කඩා දැමීමේ අවශ්‍යතාව බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදීන්ට වෙයි. සිංහල බෞද්ධ සමාජයෙහි වරදක් ලෙස පිළිගත් දෙයක් කඩා බිඳ දැමීමෙන් වාසියක් ඇත්වන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදීන්ට ය. ඒ බැමි කඩා බිඳ දැමීම ඊනියා ප්‍රගතිශීලී කාර්යයක්, නැතිනම් කුහකවත බිඳීමක්, වික්ටෝරියානු කුහකත්වයට විරුද්ධවීමක් ආදී වශයෙන් ව්‍යාජ පණ්ඩිතමානී වදන්වලින් හඳුන්වනු ලැබෙයි.

කිසිම විචාර බුද්ධියක් නැති බොරු ප්‍රබුද්ධයෝ බටහිර සංස්කෘතික යටත් විජිතවාදය වෙනුවෙන් ඒ වදන් වමාරති. වමාරා කති. ඒ අතර බටහිර සංස්කෘතික ආධිපත්‍යය හේතුකොටගෙන අප සමාජය සම්මතයක්, සම්මුතියක් නැති ජාතියක් බවට ක්‍රමයෙන් පත්වෙමින් පරිහාණියට යයි. (වික්ටෝරියානු සදාචාරය නමින් එංගලන්තයේ හැඳින්වෙන්නේ ක්‍රමයෙන් නැගී ආ ඇංග්ලිකන් ක්‍රිස්තියානි සංස්කෘතික කතෝලික සංස්කෘතික හර පද්ධතීන්ට එරෙහිව කෙරෙන අරගලයෙහි. එක් අවස්ථාවක යොදාගත් සටන් පාඨයකි. ඒ අරගලය තවමත් අවසන් වී නොමැති බව චා වින්චි කෝඩ් පොතෙන් හා චිත්‍රපටයෙන් කියැවෙයි.) සංස්කෘතිය යනු සදාචාරය නොවේ. එහෙත් රටක සදචාරය යනු කුමක්දැයි නිර්ණය වන්නේ සංස්කෘතියට සාපේක්ෂව ය. අද මෙරට පිහිරී ඇත්තේ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි කුහකත්වය නිසා නොව සමාජයේ සදාචාරය කුමක්දැයි නිර්ණය කිරීමට ඒ සංස්කෘතියට තිබූ ශක්තියක් හීනවීම නිසා ය. ඒ ශත්කිය හීන කරන ලද්දේ බටහිර නූතනත්වයේ ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය විසිනි. එහි දී මෙරට භික්ෂුන් වහන්සේට විශේෂයෙන් ම අධ්‍යාපනයේ, එහි ද සාහිත්‍ය විචාරයෙහි හා බෞද්ධ ධර්මයෙහි හා දර්ශනයෙහි තිබූ වගකීම, ලංකා විශ්වවිද්‍යාලය හා එහි අනුප්‍රාප්තික ආයතන විසින් නැතිකරන ලදී. හඳගම හාමුදුරුවන් නමින් සඳහන් කිරීම අවසානයේදී භික්ෂුන් වහන්සේට සමාජයෙහි යම් ගෞරවයක් තිබේ නම් එයද නැතිකිරීමට දායක වනු ඇත. අද මෙරට සාරධර්ම නායයෑමට වගකිවයුත්තේ බටහිට ක්‍රිස්තියානි සංස්කෘති ආධිපත්‍යය. බටහිර රටවල් සාරධර්ම ක්ෂේමභූමි යැයි ඇතැම් ප්‍රබුද්ධයන් සිතන්නේ නම් ඉන් ගම්‍ය වන්නේ එක්කෝ ඔවුන්ගේ නොදැනුවත්කමය. නැත්නම් ඔවුන්ගේ සුව කළ නොහැකි දීනකමයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva